සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

45 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................      බෞද්ධ ශිෂ්ටාචාරය I      කාලය පැය දෙකයි

**වැදගත්**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.**

**1.)** බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව බ්‍රාහ්මණ ,ක්ෂත්‍රිය වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් හඳුන්වනු ලබන්නේ.
1. වර්ණ ධර්මයයි.  2. ආශ්‍රම ධර්මයයි.  3. ස්වධර්මයයි.
4. ආපද් ධර්මයයි.  5. නියාම ධර්මයයි.

**2).** බ්‍රාහ්මණ නිර්දේශයට අනුව, එක් එක් වර්ණයන්ට වෙන් වෙන්වූ ස්වධර්මයන් නියම කොට තිබුණි. එහෙත් ඇතැම් ස්වධර්ම බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණත්‍රයට ම සමාන වන නමුත් සමහර ස්වධර්ම අසමාන වේ. ඒ අනුව ඉහත වර්ණ තුනට ම පොදු ස්වධර්මයන් වන්නේ,
1. යාග කිරීම, දන් පිළිගැනීම හා දන්දීමයි.  2. යාග කරවීම දන්දීම හා ඉගෙනගැනීමයි
3. යාග කිරීම, දන්දීම හා ඉගෙනගැනීමයි  4. යාගකරවීම, දන් පිළිගැනීම හා ඉගෙන්වීමයි
5. යාගකරවීම, දන්දීම හා ඉගෙන්වීමයි

3.) '' ආපද් ධර්මය සංකල්පය තුළින් කිසියම් වර්ණයකට අයත් අයෙක් ආපදාවකට ලක්වුවහොත් ක්‍රියාත්මක වියයුතු ආකාරය පිළිබඳව විස්තර වේ. එම විවරණයන්ට අනුගත නොවූ ප්‍රකාශය වන්නේ,
1. 'බ්‍රාහ්මණයනට ක්ෂත්‍රියනට අයත් කාර්යයන් ද කළ හැකිය.'' යන්නය.
2. ''බ්‍රාහ්මණයනට වෛශ්‍යයාට අයත් කාර්යයන් ද කළ හැකිය '' යන්නය.
3. ''ක්ෂත්‍රියනට බ්‍රාහ්මණයාට අයත් කාර්යයන් ද කළ හැකිය '' යන්නය.
4. ''ක්ෂත්‍රියනට වෛශ්‍යයාට අයත් කාර්යයන් ද කළ හැකිය'' යන්නය.
5. ''වෛශ්‍යායට ශුද්‍රයාට අයත් කාර්යයන් ද කළ හැකිය ''යන්නය.

4.) "විටෙක ආර්යයා දාසයෙක් ද, තවත් වරෙක දාසයා ආර්යයෙක් ද විය හැකි ය. පාලකයා පරදවා වෙනත් අයෙකු රජ වූ විට පාලකයා පාලිතයා බවට පත්වේ." යනාදී වශයෙන් අස්සලායන සූත්‍රයේ සඳහන් මෙම දේශනාව තුළින් බුදුරජාණන් වහන්සේ ප්‍රකට කිරීමට උත්සහ කළේ,
1. වර්ණ භේදයෙහි පවත්නා නිස්සාරත්වයයි.  2. යාගයේ පවත්නා නිස්සාරත්වයයි.
3. ආශ්‍රම ධර්මවල පවත්නා නිස්සාරත්වයයි.  4. වේදයෙහි පවත්නා නිස්සාරත්වයයි.
5. ආපද් ධර්මවල පවත්නා නිස්සාරත්වයයි.

5). බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව විවිධ නීති රීති මගින් කාන්තා නිදහස පාලනය කළ බව මූලාශ්‍රයාගත තොරතුරුවලින් පැහැදිලි වේ. ඒ අනුව බිරිඳ දිවි හිමියෙන් බොහෝ යුතුකම් හා චාරිත්‍ර ඉටු කරමින් සිය ස්වාමි පුරුෂයා අසීමිත ලෙස ගෞරවයෙන් තෘප්තිමත් කළ යුතු විය. බ්‍රාහ්මණ චාරිත්‍ර වාරිත්‍රවලට අනුව බිරිඳ විසින් ස්වාමි පුරුෂයා වෙනුවෙන් දැක්විය යුතු උසස්ම ගෞරවය ලෙස සලකා ඇත්තේ ,

1. ස්වාමිපුරුෂයාගේ දෙමව්පියන් හොඳින් රැක බලා ගැනීමය.
2. දරුවන්ගේ හා නිවසේ කටයුතු සියල්ල මැනවින් ඉටු කිරිමය.
3. ස්වාමිපුරුෂයාට නො අඩුව සිය සිතැගි ඉටු කර ගැනීමට ඉඩ දීමය .
4. ස්වාමිපුරුෂයා මිය ගිය පසු වැඩිමහල් පුතු යටතේ අවිවාහක ජිවිතයක් ගත කිරිමය.
5. ස්වාමිපුරුෂයා මළ පසු සති පූජාව පැවැත්වීමය.

6) බමුණන් විසින් විවිධාකාරයෙන් පීඩනයට ලක්කරනු ලැබූ කාන්තාවට බුදුරජාණන් වහන්සේ විසින් ලෞකික බැඳීම්වලින් නිදහස්ව ලෝකොත්තර සැප සාධනය කරගැනීමට පවා අවස්ථාව උදාකර දී තිබුණි. ඒ බව මැනවින් ප්‍රකට කරන ක්‍රියාකාරකමක් වන්නේ,

1. කාන්තාව මහා බ්‍රහ්මයාට උපමාකර වන්දනීයත්වයට පත්කිරීමෙනි.
2. කාන්තාවට භික්ෂුණියක් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සලසා දීමෙනි.
3. කාන්තාව දේවත්වයට උපමාකර පූජනීයත්වයට පත්කිරීමෙනි.
4. කාන්තාවට ද පුරුෂයාට හා සමාන අවස්ථා සමාජය තුළ සළසා දීමෙනි.
5. කාන්තාව සති පූජාවෙන් නිදහස් කිරීමෙනි.

7). මහා ප්‍රජාපතී ගෝතමිය පැවිද්ද ලැබීමෙන් අනතුරුව භික්ෂුණී ශාසනය ආරම්භ විය . එම භික්ෂුණී ශාසනයේ විනයධර භික්ෂුණීන් අතර ....................අග තනතුර ලැබුවාය.

1. සකුලා තෙරණිය. 2. නන්දා තෙරණිය 3. ඛේමා තෙරණිය
4. පටාචාරා තෙරණි ය 5. සෝමා තෙරණිය

**8.)** බුදුරදුන් පහළ වන විට ශ්‍රමණ චින්තනය තුළ විශාල අනුගාමිකයින් පිරිසකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළ ආගමිකයන් අතර ෂට් ශාස්තෘවරු ප්‍රමුඛ වෙති. මොවුන් විසින් විවිධ දර්ශන ඉදිරිපත් කරන ලදී. නමුත් ඔවුන් සියලු දෙනා ම පිළිනොගත් ආගමික මතයක් වන්නේ,

1. සියලු ම මිනිස්සු මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.
2. සමාජයේ යහපැවැත්මට කුල භේදය අත්‍යවශ්‍ය බවයි.
3. කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.
4. සියලුදෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.
5. සියලුදෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.

9). කර්මය පිළිබඳ ඉගැන්වීම් බුදුසමයේ මෙන් ම ජෛන සමයේද මූලික සිද්ධාන්තයකි. මෙහිලා පහත සඳහන් ප්‍රකාශ අතුරින් බුදු සමයට වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ ,

1. ''පෙර කරන ලද කර්මයෙන් සියල්ල සිදු වේ '' යන්නයි.
2. ''පෙර කරන ලද කර්මයෙන් කිසිවක් සිදු නොවේ '' යන්නයි.
3. ''කර්ම බීජ සියල්ල ආත්මයෙහි බැඳී ගමන් කරයි'' යන්නයි.
4. ''මනෝ කර්මය වඩාත් ප්‍රමුඛය'' යන්නය.
5. ''කාය කර්මය වඩාත් ප්‍රමුඛය'' යන්නයි.

10). සතුන් හා යාගද්‍රව්‍ය රැස්කොට සතුන් මරා පූජාකොට බමුණන්ට දන් දී කරන යාගය හඳුන්වනු ලබන්නේ,

1. අශ්වමේධ යාගය යනුවෙනි. 2. පුරුෂමේධ යාගය යනුවෙනි. 3. සම්මාපාය යාගය යනුවෙනි.
4. වාජපෙය්‍යා යාගය යනුවෙනි. 5. නිරග්ගල යාගය යනුවෙනි.

11). බුද්ධකාලයේ පැවැති මහා රාජ්‍යයන් සෑම එකකම පාහේ බුදු දහමේ ව්‍යාප්තිය සිදුවූ බවට සාක්ෂි ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් ඇතැම් විවරණයන් තුළිනුත් පුරාවිද්‍යා ගවේෂණ තුළිනුත් අනාවරණය කරගෙන ඇත. ඒ අනුව බුදුරදුන් වෙනුවෙන් එකළ ඉදිවූ ප්‍රබල ආරාම දෙකක් වූ ............................... පිහිටා තිබුනේ කෝසලය හා වත්ස යන ජනපදයන්හිය.

1 ජේතවනාරාමය හා පූර්වාරාමය
2. ජේතවනාරාමය හා වේළුවනාරාමය
3. පූර්වාරාමය හා ඝෝෂිතාරාමය
4. වේළුවනාරාමය හා රාජකාරාමය
5 නිග්‍රෝධාරාමය හා වේළුවනාරාමය

12). පටාචාරා, කිසාගෝතමී, සුමනා යන අය මෙන් ම ජානුස්සෝනි, අස්සලායන සංගාරව ආදී වශයෙන් සඳහන් බ්‍රාහ්මණ ගෘහපතීන් ද පැවිද්ද ලැබුවේ බුදුරදුන් කිනම් රාජ්‍යයේ වැඩවසන වකවානුවේද? .

1. මගධ රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.
2. කෝසල රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.
3. වත්ස රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.
4. අවන්ති රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.
5. වජ්ජි රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.

13.). පහත දැක්වෙනුයේ සොලොස් මහා ජනපදවලට අදාළ කිසියම් තොරතුරු කිහිපයකි.

A. දම්සක් පැවැතුම් සූත්‍රය
B. කූටාගාර ශාලාව
C. පස්වෙනි වස්කාලය
D.මහා කච්චායනා හිමි
E. භික්ෂුණී ශාසනය පිහිටුවීම

මෙයින් වජ්ජි රාජ්‍යයට අදාළව තොරතුරු දැක්වෙන්නේ

1. A C D වලය 2. C D E වලය 3. A B C වලය 4. B C E වලය 5. A D E වලය

14.). ක්‍රි. පූ. හයවන සියවසේ විවිධ ආර්ථික රටාවන් හා විවිධ ජීවන වෘත්තීන් පැවැති බවට තොරතුරු මූලාශ්‍ර මගින් හමු වේ. ගැල් ප්‍රවාහනයෙන් කළ වෙළදාම් ද භාරුකච්ඡ වැනි වරායන් ඔස්සේ කළ නාවික වෙළදාම ද ඒ ඒ වාණිජ නගර යා කරමින් පැවැති ප්‍රධාන වෙළඳ මාර්ග ද ක්‍රියාත්මක වීමෙන් ප්‍රකට වන්නේ,

1 බුද්ධකාලීන භාරතය වාණිජකරණයට හා නාගරීකරණයට පත් වී තිබූ බවයි.
2 බුද්ධකාලීන භාරතයේ රැකියා අවස්ථා බහුල වූ බවයි.
3 දියුණු මාර්ග පද්ධතියක් පැවැති බවයි.
4 මනා ප්‍රවාහන පද්ධතියක් පැවැති බවයි
5 නාවික මාර්ග වෙළඳාමට උපකාරී වූ බවයි.

15). වෙළඳාමේදී නොකළ යුතු වංචනික ක්‍රම ගණනාවක් දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය තුළින් බුදුරදුන් පෙන්වා දී ඇත. එම සූත්‍රයේ ඇතුළත් නොවන කරුණක් වන්නේ,

1. තුලාකූට 2. මානකූට 3. විපරාමෝස 4. උක්කෝටන 5. නිප්පේසිකතා

16). භගධර්ම ඇත්තේය, පනවන ලද සේනාසනාදිය භජනය කළේය. අර්ථ , ධර්ම ,විමුක්ති , රස භාග ඇත්තේය, ධර්මය විභාග, විශ්ලේෂණය කළේය. රාගාදි , කෙළෙස් බිඳ දැමුවේය. භාග්‍ය ඇත්තේය , භාවනාවෙන් වඩනා ලද සිත් ඇත්තේය,භවයෙහි අනන්තයට ගියේය. යන අරුතින් බුදුන්වහන්සේ ........................... නම් වන සේක.

1. බුද්ධ 2. සුගත 3. ලෝකවිදූ 4. භගවා 5. අරහං

17) බුදුරදුන් ශ්‍රාවකශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතුව දහම් දේශනා කිරීමෙන් ප්‍රකට වනුයේ

1. බුදුරදුන්ගේ ශ්‍රේෂ්ට නායකත්වයයි.
2. බුදුරදුන්ගේ විශිෂ්ට ශාස්තෘත්වයයි.
3. බුදුරදුන්ගේ අරහං ගුණයයි.,
4. බුදුරදුන්ගේ තාදී ගුණයයි.
5. බුදුරදුන්ගේ ආගමික සහනශීලීත්වයයි.

18). අෂ්ට විද්‍යාවන්ට අයත් වන්නේ පහත සඳහන් ඥානවලින් කුමක්ද?.
1. ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය
2. සබ්බත්ථ ගාමිණී පටිපදා ඥානය
3. මනෝමය ඉද්ධි ඥානය
4. අනේක ධාතු නා නා ලෝක ධාතු ඥානය
5. ඨානා ඨානා ඥානය

19) බුදුරජාණන් වහන්සේ "සම්මා සම්බුද්ධයැ"යි ප්‍රතිඥා කරන කල්හි මේ ධර්මය නුඹ විසින් අවබෝධකර නැතැයි අභියෝග කිරීමට තරම් ශ්‍රමණයෙකු බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු නැතැයි යනුවෙන් කරුණු දක්වෙනුයේ බුදුරදුන් සතු කුමන ගුණයක් සම්බන්ධයෙන්ද?
1. පුබ්බේ නිවාසානුස්සති ඥානය සම්බන්ධයෙනි.
2. චුතුපපාත ඥානය සම්බන්ධයෙනි.
3. පරචිත්ත විජානන ඥානය සම්බන්ධයෙනි.
4. චතුර්වෛශාරද්‍ය ඥානය සම්බන්ධයෙනි.
5. උපාය කෞශල්‍ය ඥානය සම්බන්ධයෙනි.

20). බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පද්මාකාර වූවකි. ඒ බව ප්‍රකට අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
1. මාරදූවරුන්ගේ හා මාගන්දියගේ පෙලඹවීම් හමුවේ විරාගිකවීම
2. පොට්ඨපාද හා සකුළුදායි පිරිවැජියාගේ අසපුවලට වැඩමකිරීම.
3. හත්ථාලවක, කෙතපාළු වූ ගොවියා හා හදවතිකා ඇතින්න සම්බන්ධ කතාපුවත්.
4. තුන්බෑ ජටිලයන්, සච්චක, සෝණදණ්ඩ ආදීන් දමනය කිරීම.
5. බුදුරදුන් මධ්‍යම ප්‍රතිපදාවෙන් යුතුව කටයුතු කිරීම

21) "පුරාණ හා ඉසිදත්ත වඩුවෝ දෙදෙනා මාගෙන් බත් වැටුප් ලබා යැපෙති. එහෙත් භාග්‍යවතුන් වහන්සේට තරම් මාහට ගෞරව නොකරති. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින දිසාවට හිස හරවා නිදාගනිති. මාගෙන් බත් වැටුප් ලබන මොවුන් බුදුරදුන්ට විශේෂ ගෞරව දක්වති."යනුවෙන් බුදුරදුන් පිළිබඳ මෙබඳු ඇගයීමක් කරනු ලැබුවේ,
1. අනේපිඬු සිටුතුමන් විසිනි.
2. අජාසත් රජතුමන් විසිනි.
3. සුද්දෝධන රජතුමන් විසිනි.
4. බරණැස් සිටුතුමන් විසිනි.
5. කොසොල් රජතුමන් විසිනි.

22). ප්‍රථම රහතුන් හැට නම ධර්ම දූත කාර්යයෙහි නිරත කරවූ බුදුරජාණන් වහන්සේ ද ධර්ම ප්‍රචාරය සඳහා උරුවේල් දනව්වට වැඩම කරලීමේ සිද්ධියෙන් අනාවරණය වන නායකත්ව ලක්ෂණය වන්නේ
1. බුදුරදුන්ගේ චින්තන හා විමංශන ශක්තියයි.
2. බුදුරදුන් තුළ පැවති අභියෝගයන්ට මුහුණ දිමේ හැකියාවයි.
3. ශ්‍රාවකයින්ට ආදර්ශ සම්පන්න වීමයි.
4. ශ්‍රාවක සුව පහසුව පිළිබඳව සොයා බැලීමයි.
5. සුදුස්සාට සුදුසු තැන ලබා දීමයි.

23). බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයිනට ධර්මය දේශනා කිරීමේදී තමාගේ මතයට අනුව මෙන් ම ශ්‍රාවක ඉල්ලීම්වලටද ප්‍රතිචාර දක්වමින් දහම් දේශනා කර ඇති අයුරු සූත්‍ර පිටකය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. ඒ අනුව බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රය දේශනා කර ඇත්තේ
1. ශ්‍රාවක අපේක්ෂාවට අනුව දේශනා කළ ධර්මයක් වශයෙනි
2. අර්ථය පැහැදිලි කිරීම සඳහා දේශනා කළ ධර්මයක් වශයෙනි
3. තමන් වහන්සේගේ අදහසට අනුව දේශනා කළ ධර්මයක් වශයෙනි
4. ශ්‍රාවක ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන් දේශනා කළ ධර්මයක් වශයෙනි
5. ධර්ම කරුණු විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීමේ අරමුණින් දේශනා කළ ධර්මයක් වශයෙනි

24). කේසපුත්ත නියම්ගම් වැසි කාලාම ගෝත්‍රිකයින්ට දේශනා කරනු ලැබූ කාලාම සූත්‍රයෙන් බුදුරදුන් අවධාරණය කරණු ලැබුවේ,
1. අටලෝ දහමින් කම්පා නොවීමේ ඇති වැදගත්කමයි
2. මෙලොව පරලොව උභයාර්ථ සාධනයෙහි ඇති වැදගත්කමයි
3. පුද්ගලයාගේ පිරිහීමට බලපාන කාරණා පිළිබඳවයි
4. කෙලෙස්වලින් ආතුර නොවී සිටීමේ ඇති වැදගත්කමයි
5. සිතීමේ හා විමසීමේ නිදහස තහවුරු කිරීමයි

25). පුද්ගලයාගේ ස්වාධීනත්වය , ස්වච්ඡන්දතාව හා වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ ,
1. ''තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය '' යන්නය.
2. '' තමාට පිහිට තමාමය අන්කිසි පිහිටක් නැත'' යන්නයි.
3. ''සරු දේ සරු ලෙසත් , නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතුය යන්නයි''
4. ''චේතනාව කර්මයට හේතුවන" බවයි
5. '' පව් කරන්නා දෙලොවම තැවෙයි'' යන්නයි.

26).' 'නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි '' යනුවෙන් බුදු දහම පිළිබඳ ඇගයීමට ලක්කළ නූතන විද්වතාණන් වන්නේ ,
1. ඇල්බට් අයින්ස්ටයින්ය. 2. මහාචාර්ය මැක්ස් මුලර්ය. 3. එඩ්වින් ආර්නෝල්ඩ්ය.
4. බර්ට්‍රම් රසල්ය. 5. මහාචාර්ය රිස් ඩේවිඩ්ස්ය.

27). ආනන්ද තෙරුන් වහන්සේ බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක ධූරයට පත්වන අවස්ථාවේ ආයචනා හතරක් සහ ප්‍රතික්ෂේප කිරීම් හතරක් සිදුකළ බව සූත්‍රාගත මූලශ්‍රයන්හි දක්වේ එසේ ඉදිරිපත් කළ ඉල්ලීම් හතරට ඇතුළත් නොවන්නේ,
1. මවිසින් කරනු ලබන ආරාධනා බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප නොකළ යුතුය.
2. බුදුරජාණන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමාට නොදිය යුතුය.
3. කවර හෝ සැකයක් තමනට ඇති වූ කල්හි එකෙනෙහි ම විචාරීමට අවස්ථාව හිමිවිය යුතුය.
4. මා නොසිටි තැන දෙසූ ධර්මය නැවැත වරක් මට දේශනා කළ යුතුය.
5. පිටින් පැමිණෙන කවරකු හෝ කැමැති වේලාවක බුදුරජාණන් වහන්සේ මුණ ගැසීමට අවසර දියයුතුයි

28). වේළුවනාරාමයේදි පැවිදි දිවියට පත්ව , සූකරකත ලෙනේදි බුදුහිමියන් දීඝනක පරිබ්‍රාජකයාට දේශනා කළ වේදනා පරිග්‍රහ සූත්‍රය අසා , රහත් බවට පත්ව ගැඹුරු දහම් කරුණු සරලව සවිස්තරව දේශනා කිරිමට හැකියාව ලැබූ මහ රහතන් වහන්සේ වන්නේ ,
1. මුගලන් හිමියන්ය. 2. ආනන්ද හිමියන්ය 3. සැරියුත් හිමියන්ය .
4. කාශ්‍යප හිමියන්ය 5. උපාලි හිමියන්ය.

29). සිව්පිළිසිඹියාපත් රහත් මෙහෙණින් වහන්සේ නමක් වු ඛේමා තෙරණිය ප්‍රඥාසම්පන්න භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත්වෙමින් බුදුසසුන වෙනුවෙන් මහගු මෙහෙවරක් සිදු කර ඇත. මෙහි සඳහන් සිව් පිළිසිඹියාවන් වන්නේ ,
1. අර්ථ , ධර්ම , නිරුක්ති , පටිභානය , 2. මෙත්තා , මුදිතා , කරුණා, උපේක්ෂා
3. ඡන්ද , චිත්ත , විරිය , විමංසාය , 4. ආයුස , සැප බල , වර්ණය ,
5. සෝවාන් , සකෘදාගාමි , අනාගාමි, අර්හත්ය.

30). චිත්ත ගෘහපති උපාසක තුමාට ගැරහීම නිසා සුධම්ම භික්ෂුවට බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රථම වතාවට පටිසාරණිය කර්මය පැනවූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වේ. පටිසාරණිය කර්මය යනු
1. ලාබ සත්කාර අහිමි කිරිමය 2. ගිහි-පැවිදි සම්බන්ධයට බාධා පැමිණවීමය
3. ගිහියන් සමග නොඇලීමය 4. ප්‍රත්‍ය පහසුකම් සපයන සැදැහැවත් ගිහියන්ගෙන් සමාව ගැනීමය.
5. ගිහියන් සමග පැවිද්දන්ට දෝෂාරෝපණය කිරීමය.

31). භික්ෂූන් වහන්සේලාට හා භික්ෂුණීන් වහන්සේලාට වැසි සළු, ආගන්තුක බත, ගමික බත, ගිලන් බත, උවටැන් බත බෙහෙත් කැඳ ආදියෙන් උවටැන් කිරීම නිසා විශාඛා මහෝපාසිකාව උභය සංඝයාගේ මාතාවක් බවට පත්වූවාය. මෙහි සඳහන් ගමික බත නම්,

1. ගිලන් වූ භික්ෂූන් වහන්සේලාට රෝගී තත්වය ගැන සලකා ලබාදෙන දානය.
2. ආගන්තුකව නගරයට වැඩම කළ භික්ෂූන් වහන්සේලාට වැළඳීමට ලබාදෙන දානය.
3. වෙනත් ගමකට ගොස් ආපසු වැඩම කිරීමෙන් අනතුරුව වැළඳීමට ලබාදෙන දානය.
4. වෙනත් ගමකට වැඩම කොට වැළඳීම සඳහා ලබාදෙන දානය.
5. දුරබැහැර ගමන් යාමට සිටින භික්ෂූන් වහන්සේලාට වේලාසනින් ලබාදෙන දානය

32). ''අත්තදීපා විහරථ භික්ඛවේ අත්ත සරණා අනඤ්ඤ සරණා '' යන පාඨය මෙන් ම **"සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො විසෝධයේ "** පාඨය වඩාත් අදාළ වන්නේ ,

1. වර්ණ ධර්ම බැහැර කිරීමටය
2. පුද්ගල ශක්තිය හා ස්වධීනත්වය පිළිබිඹු කිරීමටය.
3. බුදුදහමේ සිතීමේ හා විමසීමේ නිදහස තහවුරු කිරීමටය
4. බුදුරදුන්ගේ තාදී ගුණය පිළිබිඹු කිරීමටය.
5. මානව වර්ගයාගේ ඒකත්වය සනාථ කිරීමටය.

33). පුද්ගල ස්වාමිත්වය තහවුරු කිරීමට බුද්ධකාලීන සමාජයේ විසූ විවිධ ආගමික කොට්ඨාසයන් විසින් ඉදිරිපත් කරන ලද ඉගැන්වීම් අතුරෙන් නිවැරදි මතය වන්නේ ,

1. පුද්ගලයා මහා බ්‍රහ්මයාගේ පරමාත්මයට අයත්වන බවයි.
2. ස්වාමිත්වය ලබා ගැනීම සඳහා නිශ්චිත යාගහෝම කළ යුතු බවයි.
3. අනිවාර්යයෙන් ම ආශ්‍රම ධර්ම සම්පූර්ණ කළ යුතු බවය.
4. නිදහසේ සිතාමතා නිවැරදිව ක්‍රියා කළ යුතු බවයි.
5. සියලු ම ආගමික ඉගැන්වීම් ප්‍රතික්ෂේප කළ යුතු බවයි.

34). පුද්ගලයාගේ ස්වාධීනත්වය ස්වච්ඡන්දතාව හා වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1.''තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය '' යන්නය.
2. '' පව් කරන්නා දෙලොවම තැවෙයි'' යන්නයි.
3. ''චේතනාව කර්මය වේ.'' යන්නයි.
4. '' සරු දේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතුය ' යන්නයි.
5. ''තමාට පිහිට තමාමය අන්කිසි පිහිටක් නැත'' යන්නයි.

35). ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්පච්චයවාදය, යනාදි ඉගැන්වීම්වලට සාපේක්ෂව බුදුසමය හොඳ -නරක තෝරා බේරා ගෙන කටයුතු කිරීමට පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් ඇතැයිද, යම් ක්‍රියාවක් ආරම්භ කිරීමටත් නොකඩවා පවත්වාගෙන යාමටත් , බාධා ජය ගැනීමටත් හැකියාව ඇතැයිද, අවධාරණය කරයි. මෙමගින් තහවුරු වන්නේ,

1. පුද්ගල ශක්‍යතාව පිළිගන්නා බවය.
2. පුද්ගල නිරවද්‍යතාව පිළිගන්නා බවය.
3. පුද්ගල අනන්‍යතාව පිළිගන්නා බවය.
4. පුද්ගල අර්ථසිද්ධිය පිළිගන්නා බවය.
5. පුද්ගල ඒකාබද්ධතාව පිළිගන්නා බවය.

36). පුද්ගල ස්වාමිත්වය, ස්වච්ඡන්දතාව හා ස්වාධීනත්වය ප්‍රකට කරන ''අත්තකාර'' සූත්‍රයේ දැක්වෙන, පරක්කම ධාතු, යන්නෙහි අර්ථය වන්නේ,

1. ක්‍රියාවක් ආරම්භ කිරීමට ඇති ශක්තියයි
2. වීර්යය පවත්වාගෙන යාමට ඇති ශක්තියයි .
3. ස්ථාවර වීර්යයකට පැමිණීමට ඇති ශක්තියයි
4. ක්‍රියාව සාර්ථක කර ගැනීමට උපක්‍රම යෙදීමට ඇති ශක්තියයි
5. ක්‍රියාව ආරම්භ කිරීම සඳහා අලස කමින් තොරව කටයුතු කිරීමට ඇති ශක්තියයි

37). අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන පරිදි ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පැමිණ රස පොළොව ආහාර ලෙස ගැනීමට පෙර සත්වයින් තුළ දක්නට ලැබුණ ලක්ෂණයන් අතුරෙන් එකක් වන්නේ ,
1. ස්වයංජාත හැල් ආහාරයට ගැනීම 2. ස්ත්‍රී පුරුෂ භේද සහිත වීම
3. ශරීරය ක්‍රමයෙන් රළු වීම. 4. මහත් වූ ශරීරයකින් යුක්ත වීම
5. ප්‍රීතිය ආහාර කොට ගෙන විසීම.

38). හේතුඵලවාදී මූලධර්මය මත පදනම්ව සමාජය ක්‍රමිකව පරිනාමය වූ බව බෞද්ධ ඉගැන්වීමයි. මෙකී සන්දර්භය තුළ ආර්ථික , ආගමික හා ගෘහස්ථ, සමාජ සංස්ථා ප්‍රභවය වූයේ ,
1. පුද්ගල ස්වධීනත්වය තහවුරු කිරිමට දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි.
2. පුද්ගලාන්තර සම්බන්ධතා ගිලිහී ගිය හෙයිනි.
3. පුද්ගලයාගේ අත්තනෝමතික ක්‍රියා කාරකම්වල ප්‍රතිඵලයක් වශයෙනි.
4. නිර්මාණවාදී සංකල්ප බැහැර කිරිමේ ප්‍රතිඵලයක් වශයෙනි.
5. පුද්ගලයා සිය ගැටලුවලට විසඳුම් සෙවීමට යාමේ ප්‍රතිඵලයක් වශයෙනි.

39). ඉපැරණි භාරතය තුළ රෙදිපිළි කර්මාන්තය සඳහා ප්‍රචලිතව පැවැති ප්‍රදේශයක් වනුයේ
1. පාටලී පුත්‍රය 2. සැවැත්නුවර 3. බරණැස 4. උජ්ජේනි 5. රජගහනුවර

40). ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ ප්‍රකට ශාස්තෘවරුන් හයදෙනෙක් ලෙස ෂට් ශාස්තෘවරුන් සැලකේ. ඔවුන් ඉදිරිපත් කළ දර්ශනවාද කිහිපයක් මතු දැක්වේ.
A. නියතිවාදය B. පුබ්බේකතහේතුවාදය C. අහේතු අප්පච්චයතාවාදය
D. සාස්වතවාදය E. සංසාර ශුද්ධිවාදය
මෙම දර්ශනවාදවලින් මක්ඛලීගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් දක්නට ලැබෙනුයේ
1. A C Eවලය 2. A D Eවලය 3. B C Dවලය 4. B C Eවලය 5. C D Eවලය

41) බ්‍රහ්මජාල සූත්‍රයට අනුව **"එවන්තිපි මේ නෝ තථාතිපි මේ නෝ අඤ්ඤතාතිපි මේ නෝ නෝතිපි මේ නෝ නෝ නෝතිපි මේ නෝ......** යනාදි ලෙසින් මහජනයා වික්ෂිප්තියට පත්වන අයුරින් දර්ශනයක් ඉදිරිපත් කළ බුද්ධකාලීන ශාස්තෘවරයකු වූයේ,
1. පූර්ණ කස්සපය. 2. පකුධ කච්චායනය. 3. අජිත කේස කම්බලිය.
4. සංජය බෙල්ලට්ඨිපුත්තය. 5. මක්ඛලි ගෝසාලය..

42) කර්මය ක්ෂය කිරීමෙන් මෝක්ෂය ලැබිය හැකිබව ප්‍රකට කරමින් කර්මය තැවීම සඳහා ශරීරයට දැඩි දුක්දෙමින් කටයුතු කළ ශ්‍රමණ පිරිස වූයේ,
1. ජටිලයන් ය. 2. ජෛනයන් ය. 3. පරිබ්‍රාජකයන් ය. 4. තාපසයන් ය. 5 ආජීවකයන් ය.

43.) වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සෑම රාජ්‍යයක ම කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට අදාළ විවිධ නීති රීති සම්පාදනය කොට, කාන්තා අයිතීන් වෙනුවෙන් ඒවා ක්‍රියාත්මක වීමක්ද සිදුවේ. බුදු රදුන් ද දැහැමි රාජ්‍ය පාලනය සඳහා ඉදිරිපත් කළ ඇතැම් ඉගැන්වීම්වලද කාන්තා අයිතීන් සුරක්ෂිත කිරිමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත කාන්තා අයිතීන් සුරක්ෂිත කෙරුණු ඉගැන්වීම් ඇතුළත් රාජ්‍ය පාලන ධර්මය වන්නේ ,
1. දස සක්විති වත්ය. 2. දස රාජ ධර්මය 3. සප්ත අපරිහානී ධර්මය
4. පඤ්ච සීල ප්‍රතිපදාවය 5. සතර අගතියෙන් තොරවීමය.

44). ජාතකපාළියේ දස රාජධර්ම සර්ව කාලීන වටිනාකමකින් යුත් පාලන මුල ධර්මයක් ලෙස සැලකෙන අතර එහි පවත්නා එකිනෙක ධර්ම කරුනු විමසා බැලීමෙන් එය පැහැදිලි වේ. ඒ අනුව මහජනයා සමගත් නොගැටී සහයෝගයෙන් ක්‍රියා කිරිම (..................) අයත් ,වේ.
1. ඉවසීමටය 2. ක්‍රෝධ නොකිරීමට. 3. ඍජු බවටය 4. විරුද්ධ නොවීමටය 5. අවිහිංසාවටය.

45). අනුන් නොනස්වමින්, නොපරදවමින්, ශෝක ඇතිනොකරමින් දැහැමින් රාජ්‍ය පාලනය කළ නොහැකිද? යනුවෙන් රාජ්‍ය පාලනය සම්බන්ධව මෙබඳු සිතුවිල්ලක් ඇතිවූයේ කවුරුන් තුළද?
1. සැරියුත් මහරහතන් වහන්සේ තුළය. 2 . බුදුරජාණන් වහන්සේ තුළය.
3. අශෝක රජතුමා තුළය. 4 . කොසොල් රජතුමා තුළය.
5. මොග්ගලී පුත්තතිස්ස මහරහතන් වහන්සේ තුළය.

46). රටක් යහපත් ආකාරයෙන් දියුණුව කරා යොමු කිරිම හුදෙක් පාලක පක්ෂයට පමණක් සිදු කළ හැකි කරුණක් නොවේ. ඒ සඳහා ජනතාවගෙන් ඉතාවැදගත් කාර්යභාරයක් ඉටුවිය යුතුය . ජනතාවගෙන් ඉටුවිය යුතු කාර්යභාරයට ඇතුළත් නොවන්නේ,
1. නිසි පරිදි බදු මුදල් ගෙවීමය.
2. ආපදාපන්න අවස්ථාවලදී ඉවසීමෙන් ක්‍රියා කිරිමය.
3. අධිපරිභෝජනයෙන් වැළකී සම්පත් ආරක්ෂා කිරිමට කටයුතු කිරිමය.
4. රජයේ සම්පත් අවභාවිතයට යොමු නොවීමය.
5. පෞද්ගලික සුභ සිද්ධිය ගැන සලකා කටයුතු කිරිමය.

47). දැහැමි රාජ්‍ය පාලකයෙකු විසින් උපයෝගි කර ගත යුතු ගුණ ධර්ම දහයක් ජාතක පාළියේ දසරාජධර්ම නමින් හැඳින්වේ. එම දසරාජධර්මයන්හි අනුපිළිවෙළ අනුව මුල් ධර්මතා තුන දැක්වෙන වරණය කුමක්ද?.
1. දාන , ශිල, භාවනා , 2. දාන , ශිල , නෙක්ඛම්ම, 3. දාන , ශිල , පරිත්‍යාගය.
4. දාන , ශීල, ඉවසීම, 5. දාන , ශිල , ප්‍රඥා

48). දිළින්දන්ට ධනය නොලැබීම නිසා දිළිඳුකම වැඩිදියුණු වී එකිනෙක අසද්ධර්මයන් සමාජය තුළ හේතුඵල න්‍යායයට අනුරූපීව ක්‍රමයෙන් වර්ධනය වන අයුරු චක්කවත්ති සීහනාද සූත්‍රයේ දක්වා ඇත. ප්‍රාණඝාතය හේතු කරගෙන ඊළඟට ඇතිවන අසද්ධර්මය ලෙස සූත්‍රයේ සඳහන් වන්නේ,
1. කේලාම් කීම 2. අවි ආයුධ දරන ප්‍රමාණය වැඩි වීම. 3. බදු මුදල් වැඩි වීම.
4. බොරු කීම 5. පරහිංසාව .

49). දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව සමාජ ප්‍රභවය හා විකාශය පටිච්චසමුප්පාද මූලධර්ම මත ඉදිරිපත් වී ඇත. එහි දක්වෙන ක්‍රියාදාමයන් කෙරෙහි පාරිසරික මෙන් ම මනෝවිද්‍යාත්මක සාධක ද බලපා ඇත. ආර්ථික, දේශපාලනික, ආගමික හා සමාජ සංස්ථා ද පුද්ගලයා සිය ගැටලුවලට විසඳුම් සෙවීම තුළින් හටගෙන ඇත. මේ තුළින් එළඹිය හැකි නිගමනය වවන්නේ,
1 සමාජ පරිණාමයේදී තණ්හාව මූලික ක්‍රියාකාරිත්වය බොහෝ ගැටලුවලට හේතු වී ඇති බවයි.
2. පෞද්ගලික පරිහරණයට පුද්ගලයා යොමුවීම නිසා ගැටලු නිර්මාණය වූ බවයි.
3. සොරකම දුරුකිරීමට දඩුවම් ලබා දිය යුතු බවයි.
4. සමාජ සංස්ථාවන්හි ආරම්භය ජන්මය මතසිදු වී ඇති බවයි.
5 ප්‍රසිද්ධියේ මෛථුන සේවනය කිරීම ජනයාගේ නිග්‍රහයට හේතු වූ බවයි.

50). සමාජයේ ඕනෑම පුද්ගලයෙකුට යහපත් ආකාරයෙන් පැවතීමට උපකාරිවන පිළිවෙතක් ලෙස සිව් සඟරාවත් සැලකේ. මෙය පාලකයෙකු වශයෙන්ද අනුගමනය කළ යුතු දේශපාලන මූල ධර්මයක් වශයෙන් වැදගත් වේ. මෙම සිව්වැදෑරුම් ප්‍රති පදාවේ ''අර්ථචර්යාව'' යනුවෙන් අදහස් කරනුයේ ,
1. මෙරමාගේ දියුණුව පිණිස කටයුතු කිරිමයි.
2. ස්වාර්ථය පිණිස කටයුතු කිරිමයි.
3. ස්වාර්ථය හා පරාර්ථය පිණිස උනන්දු වීමයි.
4. සියලූ දෙනාට සමානව සැලකීමයි.
5. ජනතාවගේ දැහැමි ආරක්ෂාව සඳහා කැපවීමයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

45 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ............................

# බෞද්ධ ශිෂ්ටාචාරය II

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

1. i. බ්‍රාහ්මණ වර්ණයට නියමකර තිබූ ස්වධර්ම නම් කරන්න.
   ii. බ්‍රාහ්මණ වර්ණයේ සම්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
   iii. ආපද් ධර්ම තුළින් බමුණන් වැඩිවාසි හිමිකරගත් අයුරු පැහැදිලි කරන්න.
   iv. යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා කෙටියෙන් දක්වන්න.
   v. බ්‍රාහ්මණ ආගමික සම්ප්‍රදාය තුළ කාන්තාව පුරුෂාධිපත්‍යයට යටත් කොට පාලනය කළ බවට සාධක තුනක් ගෙන හැර දක්වන්න.

2. i සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
   ii. එම ඉගැන්වීම් බුදුදහමින් බැහැරකරන්නේ කුමක් නිසාද'යි පෙන්වා දෙන්න.
   iii. බුද්ධකාලීන භාරතයේ ආර්ථික සංවර්ධනයට දායක වූ පේෂකර්මාන්තය හා කුම්භකාර වෘත්තිය පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වන්න.
   iv බුද්ධකාලීන භාරතයේ ක්‍රියාත්මක වූ ප්‍රධාන රාජ්‍ය හතර පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   v. දස සක්විතිවත් නම්කරන්න.

3. i. ත්‍රිවිද්‍යා ඥානය හඳුන්වා දෙන්න.
   ii. බුදුරදුන්ගේ අරහං ගුණය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් සපයන්න.
   iii. උපමානුසාරයෙන් දහම් දෙසීමෙහිලා බුදුරදුන් තුළ පැවැති ශක්‍යතාව උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න.
   iv. බුදුසිරිතේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස යථාවාදී - තථාකාරී ගුණය උදාහරණ මගින් පැහැදිලි කරන්න.
   v. මහාප්‍රජාපතී ගෝතමිය සතුව පැවැති ගුණාංග හතරක් පෙන්වා දෙන්න.

## II කොටස

**( මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

4. i රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහිලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතුද'යි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න.
   ii පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව පිළිබඳ සමකාලීන ඉගැන්වීම්, බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රතික්ෂේප වන අයුරු විමර්ශනය කරන්න.

5. i සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පාරභෞතික ප්‍රස්තුතවලින් බැහැරව හේතුඵල දහමට යටත්ව සිදුවූවක්බව පෙන්වා දෙන්න .
   ii නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මානව වර්ගයාගේ ප්‍රගමනයට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

6. i. බෞද්ධ ගුණධර්ම අතර කරුණාවට හිමි තැන අගයමින් බුද්ධ චරිතයෙන් එය පිළිබිඹු වන අවස්ථා පෙන්වා දෙන්න.
   ii. පුද්ගල හා සමාජ උන්නතිය උදාකරලීමට පඤ්චශීල ප්‍රතිපදාව උපයෝගීකර ගතහැකි ආකාරය පිළිබඳ විවරණයක් සපයන්න.

7. i. ෂට් ශාස්තෘවරුන් විසින් ඊශ්වර නිර්මාණවාදය ප්‍රතික්ෂේප කිරීමට යොදාගත් සාධක ගෙනහැර දක්වන්න.
   ii. බුද්ධකාලීන භාරතයේ දියුණු වෙළඳ ආර්ථිකයක් පැවැති බව සනාථ කරන්න.

8. i. බුදුරජාණන් වහන්සේ සමකාලීන ආගමික චින්තකයින්ගේ ඇගයීමට ලක්වීමට බලපෑ හේතු මොනවාද'යි පිරික්සන්න.
   ii. ගණතන්ත්‍ර පාලනයන්හි පවත්නා ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණ සදාචාරවත් දේශපාලන සංස්කෘතියක් උදාකිරීමට උපකාරීවන අයුරු විමසීමට ලක්කරන්න.